# මුව යාළුවෝ



**ඉමාෂි මෙත්සරා පීරිස්.**

කෘතියේ නම : මූව යාලුවෝ

2025

කතෘ ප්‍රකාශනයකි.

ISBN:  978-624-208-738-2



කථාව සහ චිත්‍ර - ඉමාෂි මෙත්සරා පීරිස්.

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර.

ඉගෙනුම ලබන පංතිය  3 වසර B

කර්තෘගේ වෙනත් කෘති: තැනට සුදුසු නුවණ.

කෘතිය ප්‍රකාශිත දිනය: 2025.02.08

# පිදුම

කුඩාකල සිට අකුරු කියාදුන්

සියලුම ගුරුවරුන්ට සහ පියවරුන්ටත්

මාගේ දෙමව්පියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහා සයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සා හිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර් පාසල් ප්‍රජාවම ආදි කර්තෘකරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදායම රට තුළ යළි ගො ඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යො මු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය. මෙම ශා ස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැ බීම එහි විදුහල්පතිනියෙන් මාහට අබිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය ,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක දවස කැලෑවක  ලස්සන මුව පැටව් හතර දෙනෙක් හිටියා.

මේ මුව පැටව් හතර දෙනා හොඳම යාළුවෝ.

හැමදාම උදේම නැගිටලා සෙල්ලම් කරන්න කැලෑව මැදට එනවා .



මේ යාළුවෝ තණකොළ කන්න යන්නේ සෙල්ලං කරන්නේ එකට,

බොහොම සතුටින් සමගියෙන් තමයි මේ හතර දෙනා කාලය ගත කළේ.

මේ අය මෙච්චර සමඟියෙන් ඉන්නවා දැකලා කැලේ යාළුවො ගොඩක් සතුටු වුනා.

කැලේ ගොඩක් සතුන් මේ මුව පැටව් හතර දෙනාගේත් හොඳම යාලුවෝ.



ඉතින්  සෙල්ලම් කරන්න යද්දී කැලේ ඉන්න ගොඩක් සත්තු මේ කට්ටියත් එක්ක සෙල්ලම් කරන්න එනවා .

උදේ ඉඳන් හවස් වෙනකම් සෙල්ලම් කරනවා .

ඔය අතරේ මුව පැටව් දිහා හොරෙන් බලාගෙන හිටපු සිංහයෙක් හිටියා.

සිංහයාමේ මුව පැටව් හතර දෙනාව ගොදුරු කරගන්න තමයි බලාගෙන හිටියේ .

ඒක මේ මුව පැටව් හතර දෙනාදැනගෙන හිටියේ නෑ.

මුව පැටව් හැමදාම එකම විදිහට සෙල්ලම් කරා



මේ සිංහයාමේ මුව යාලුවෝ හතර දෙනාළඟට එනකොට යාලුවෝහතර දෙනාඑකතු වෙලා පන්නාදමනවා.



මෙහෙම කාලයක් ගත වුණා යාළුවෝ හතර
දෙනා අතර රණ්ඩු ඇතිවුණා.

ඔවුන් තරහාවෙලා වෙන් වුණා.
සත්තු යාළුවොඔක්කොටෝම දුකයි .



මුව යාළුවෝහතර දෙනාම වෙන වෙනම තනි තනිව තණකොළ කන්න පටන් ගත්තා.

එකට සෙල්ලම් කලෙත් නෑ.



මේ දෙස හොඳින් බලාසිටිසිංහයාමුව පැටව් හතර දෙනාම එක් එක් දිනවල ආහාරයට ගත්තා.





අපි සමගිව හිටියොත් හැමදේම එකට කරගෙන අපිත් ආරක්ෂාවෙන්න පුළුවන්.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙසේ රෝපණය කිරීමට ලැබීම අප ලැ බූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප , පළාත් , ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියි මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේ පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචිගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘසම්බන්ධීකාරක ,

සෙනවිරත්න මහලේකම්.